මීරිගම ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
---------------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මීරිගම සතිපොළ ගොඩනැගිල්ල කඩා ඉවත්කර ඇතත් එය ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.1,737,500 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගතකිරීම කළයුතු වේ. | 2020 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ඉවත්කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු.3,121,000 ක් වූ වේවැල්දෙනිය උප කාර්යාල ඉඩම රු.240,170 ක් වූ පරිගණකයක් හා රු.2,625,895 ක් වූ ලී බඩු හා සවි කිරීම් අයිතම 22 ක්ද ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කළයුතු වේ. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී කොම්පෝස්ට් බඳුන් අලෙවියෙන් ලද ආදායම් රු.76,000 ක් තැන්පත් ලෙස ගිණුම්ගතකර තිබුණි. | අදායම් නිවැරදිව ගිණුම්වල පෙන්වියයුතු වේ. | සභා ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | ණයහිමි ශේෂය තුළ රු.141,430 ක හඳුනාගත නොහැකි අගයක් ගිණුම්ගතකර තිබුණි. | නිශ්චිත නොවන ණයහිමියන් සඳහා මුදල් වෙන් නොකළයුතු වේ. | මෙම මුදල කපාහැරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සැපයුම් හා උපකරණ වියදම් ගිණුමේ ශේෂය ආදායම් වියදම් ගිණුමට මාරු කිරීමේදී රු.130,658 ක් ලෙස අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීම කළයුතු වේ. | මෙවැනි අතපසුවීම් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. |

1.3.2 **නොසැසඳුනු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 13 ක එකතුව හා උපයෝගී ලේඛන අනුව එම එකතු වටිනාකම අතර රු.5,579,310 ක වෙනසක් පැවතුණි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.386,959,341 ක් වූ අයිතම 06 ක් සඳහා ලේඛන යාවත්කාලීන නොකිරීම, ලේඛන හා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | ගණුදෙනු සඳහා අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරියේදී ඉදිරිපත් කරමි. |
| (ආ) | රු.1,785,841 ක වටිනාකමැති ඉඩම් හා ගොඩනැගිලි 17 ක් සඳහා පැවරුම් නියෝග හා ඔප්පු නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා පැවරුම් නියෝග හෝ ඔප්පු ලබාගත යුතු වේ. | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සඳහා පැවරුම් නියෝග හෝ ඔප්පු ලබා ගැනීමට කටයුතු කරමි. |

1.3.4 **ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමෙන් රු.6,801,344 ක් සහ ලීබඩු හා සවිකිරීම් ගිණුමෙන් රු.116,705 ක් ඉවත් කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය ලබාගතයුතු වේ. | ඉදිරියේදී විධිමත් අනුමැතිය යටතේ සිදු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | | | |
| | (i) මීරිගම උප කාර්යාලයේ අය විය යුතු ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු 11,340 ක් හා පල්ලෙවෙල උප කාර්යාලයේ අය විය යුතු බදු ආදායම් හා බදුකර වටිනාකම | විධිමත් අනුමැතියක් ලබාගතයුතු වේ. | මීරිගම උප කාර්යාලයේ අයවිය යුතු කර්මාන්ත හා ව්‍යාපාර බදු රු.7,340.00ක් හා බලපත්‍ර ගාස්තු කපා හැරීමට අනුමැතියට යවා ඇති අතර, |

| | | |
|---|---|---|
| රු.64,281 ක් විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | | මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. |
| (ii) සමාලෝචිත වර්ෂයේදී රු.3,424,615 ක ඇක්සයිස් පොත් මිලදීගෙන බෙදාහැරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | පූර්ව අනුමැතිය මත මිලදීගැනීම් සිදුකල යුතු වේ. | අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. අනුමැතිය තවමත් ලැබී නොමැති බැවින් ගෙවීම් සිදුකර නොමැත. |
| (iii) සමාලෝචිත වර්ෂයේ වටිනාකම රු.2,351,028 ක් ඉඩම් හා ගොනැගිලි අයිතම 13 ක් අනුමැතිය රහිතව ගිණුම්වලින් ඉවත්කර තිබුණි. | විධිමත් අනුමැතිය ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී ගිණුම්වලින් මෙවැනි ඉවත් කිරීම් සිදු කරන විට විධිමත් අනුමැතිය යටතේ සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.4 **අනුකූල නොවීම්**

**-------------------**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**---------------------------------------------------------------------------**

| **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | වරිපනම් බදු අයකිරීම සඳහා නව තක්සේරුවක් 2009 වර්ෂයෙන් පසු සිදු කර නොතිබුණි. | පනත ප්‍රකාරව වර්ෂ 5 කට වරක් වරිපනම් බදු තක්සේරු කළයුතු වේ. | 2013 වර්ෂයේ සිට නව තක්සේරුව ලබා ගැනීම සඳහා මහා සභා තීරණ ලබා ගෙන තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදු කර ඇත. එකී ඉල්ලීම ඉටු නොවුන විට 2015 වර්ෂයේ සිට වරිපනම් බදු අය කිරීමේ ප්‍රතිශතය 3% සිට 5% දක්වා වැඩි කරමින් ආදායම වැඩි කර ගැනීමට කටයුතු කර ඇත. |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

**--------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,789,986 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුල වසර 01-03 දක්වා රු.79,325 ක්, වසර 05 – | අයවියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | අයවියයුතු ශේෂ අයකිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| 10 දක්වා රු.13,226 ක්, හා වර්ෂ 10 ට වැඩි රු.6,176,114 ක් පැවතුණි. වර්ෂ 10 ට වැඩි ශේෂය තුල පෞද්ගලික ආයතනයකට වැඩිපුර ගෙවා තිබූ අත්තිකාරම් රු.3,748,794 ක් හා හඳුනානොගත් රු.17,139 ක ශේෂයක්ද පැවතුණි. | | |

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට රු.90,615,551 ක් වූ ණයහිමි ශේෂය තුල රු.15,675,106 ක හඳුනා නොගත් ශේෂයක්ද, වසර 05 ට වැඩි රු.1,813,793 ක් හා වසර 1 සිට 5 දක්වා රු.9,803,251 ක ශේෂයක්ද පැවතුණි. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ගෙවිය යුතු ශේෂ ගෙවීමටත් ඉතිරිය හඳුනාගෙන කපා හැරීමටත් කටයුතු කරමින් පවතී |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට රු.27,677,960 ක් වූ ආපසු ගෙවියයුතු තැන්පත් ශේෂය තුල වර්ෂ 01 ට අඩු රු.6,086,414 ක්, වර්ෂ 01- 03 අතර රු.3,767,860 ක්, වර්ෂ 03 - 05 ත් අතර රු.1,222,249 ක් හා වර්ෂ 05 ට වැඩි රු.15,000 ක් පැවති අතර හඳුනා නොගත් රු.16,586,436 ක ශේෂයක්ද පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී උපදෙස් පරිදි කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,023,119 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,943,365 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,078,000 | 12,647,906 | 12,857,902 | 5,766,650 | 13,440,000 | 11,239,500 | 10,912,391 | 5,893,658 |
| කුලී | 41,118,000 | 29,675,510 | 28,724,868 | 4,570,211 | 23,110,000 | 25,427,754 | 22,949,530 | 3,635,115 |
| බලපත්‍ර ගාස්තු | 2,041,500 | 1,665,024 | 1,666,024 | 64,775 | 2,163,350 | 1,682,083 | 1,683,083 | 60,725 |
| වෙනත් ආදායම් | 224,343,000 | 277,054,531 | 234,747,197 | 84,110,622 | 169,595,850 | 148,313,467 | 170,669,237 | 41,601,297 |
| | 282,580,500 | 321,042,971 | 277,995,991 | 94,512,258 | 208,309,200 | 186,662,804 | 206,214,241 | 51,190,795 |

### 2.2.1 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් කාල විශ්ලේෂණය අනුව වසර 1 සිට 3 දක්වා රු.1,982,359 ක්, වසර 3 සිට 5 දක්වා රු.606,229 ක්, වසර 05 සිට 10 දක්වා රු.2,525,189 ක් හා වසර 10 ට වැඩි රු.569,690 ක් අයකර ගතයුතුව පැවතුණි. | වරිපනම් අයකිරීමේ ක්‍රියාමාර්ග සක්‍රිය කළයුතු වේ. | හිඟ ආදායම් අයකිරිමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 වන විට වරිපනම් ඒකක 300 කින් වරිපනම් අයනොවී පැවති නමුත් දේපල තහනම් කිරීමේ නිවේදන නිකුත්කර තිබුණේ දේපල 75 කට පමණි. | හිඟ ශේෂ අයකිරීමට කටයුතු කළයුතු වේ. | දේපල තහනම් කිරීමේ නිවේදන නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | පළාත්පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමත කර එවා ඇති කාරණා 15ක් සම්බන්ධ අතුරු ව්‍යවස්ථා අප විසින් වැලඳගෙන ඇති බව දන්වමි. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 15 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුනමුත් එහි ප්‍රගතිය විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | ඉටුකලයුතු කාර්යයන් සියල්ලම ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළයුතු අතර එහි ප්‍රගතිය ඉදිරිපත් කළයුතු වේ. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ලබාදීමට කටයුතු කරන බව දන්වමි |

(ඇ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය වර්ෂයේ ලැබී තිබූ පැමිණිලි 435 න් 98 ක් හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මහජන පැමිණිලි 519 කින් 403 ක් විසඳා නොතිබුණි. | මහජන පැමිණිලි කඩිනමින් විසඳීමට කටයුතු කළයුතු වේ. | ඇතැම් ගැටළු විසඳීමට වෙනත් ආයතන සම්බන්ධ කර ගැනීමට සිදුවීම හා පැමිණිලි හා විත්ති පාර්ශවය එකඟතාවයකට නොපැමිණීම ආදී කරුණු මත නොවිසඳී ඇති අතර ඒවා විසඳීමට කටයුතු කරමින් පවතී. |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2015 සිට 2030 අතර කාලය තුළදී ළඟාකරගැනීමේ මූලික පියවරයන් ආරම්භ කර තිබූ අතර එහිදී ආර්ථික සංවර්ධනය හා මානව සංවර්ධනය සඳහා හොඳ ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇති කිරීම, නිසල පරිසරයක් ඇතිකිරීම, නිරෝගීමත් ජීවිතයක් සහතිකකර වයස්ගතව සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම යන ඉලක්කයන් කෙරෙහි අවධානය යොමුකර තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකරගැනීම කළමනාකරණයේ අවධානය යොමු කළයුතු වේ. | එකඟවෙමි. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මීරිගම දුම්රියපල අසල වාණිජ සංකීර්ණයේ. කඩ කාමර සම්පූර්ණ කුලී මුදලද කඩ කාමර 03 කින් කුලී කොටසක් ද වන රු.58,138,360 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු කඩ කාමර කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | නැවත ටෙන්ඩර් කිරීමට කමිටුව නිර්දේශ කර ඇත. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආදායම් පරීක්ෂක තනතුරු දෙකක් 2006 හා 2013 වර්ෂ වල සිටද, පෙර පාසල් ගුරු තනතුරු 02 ක් 2014 වර්ෂයේ සිටද, සෞඛ්‍ය පරිපාලක තනතුර 2012 සිටද වැඩ ක්ෂේත්‍ර කම්කරු 07 ක් 2017 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී මෙම පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.519,302 ක්ද, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 04 ක ගෙන් රු.256,701 ක් ද සේවය අත්හිටවූ නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු.263,115 ක්ද අයවිය යුතුව තිබුණි. | අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකිරීමට හා කපාහැරීමට කටයුතු කරමි. |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව වටිනාකම රු.2,085,182 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 21 ක් සඳහා පැවරුම් ඔප්පු ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පවරාගැනීමට කටයුතු කළයුතු වේ. | ඔප්පු ලබා නොගත් ස්ථාවර වත්කම් සඳහා ඔප්පු ලබාගැනීමට හෝ පවරාගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.4.2 **නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2007 වර්ෂයේදී රු.700,000 කට මිලට ගත් ට්‍රැක්ටරයක්, 2008 වර්ෂයේදී රු.1,319,000 කට මිලට ගත් මහේන්ද්‍රා කැබ් රථය 2013 වර්ෂයේදී රු.4,999,500 කට මිලදීගත් බැකෝ ලෝඩර් යන්ත්‍රය, වටිනාකම නොදත් තාර බොයිලරය හා ඩම්පරය ප්‍රයෝජනයට යොදාගත නොහැකිව සභාවේ ගාල්කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.5 **ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ 23W ප්‍රතිදීප්ත (CFL) විදුලි බල්බ මිලට ගැනීම සඳහා ටෙන්ඩරය පිරිනැමූ ආයතනය සමග ගිවිසුම්ගත නොවීම හේතුවෙන් ටෙන්ඩර්කරු බල්බ 1000 ක් සැපයීමෙන් අනතුරුව සැපයීම ප්‍රතික්ෂේපකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළයුතු වේ. | ටෙන්ඩරය පිරිනැමූ ආයතනය සමඟ නොපමාව ගිවිසුම් ගතවීමට කටයුතු කරන බව දන්වමි. |